සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගම - 2019
--------------------------------------------------------------------

**1.1** මතය
-----

සීමාසහිත ශ්‍රී ලංකා එනර්ජීස් එච්ආර් (පුද්ගලික) සමාගමේ ("සමාගම") 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන්, සාරාංශගත වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්තිවලින් සමන්විත 2019 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

සමාගමේ 2019 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහ සත්‍ය හා සාධාරණ ලෙස දැක්වෙන අයුරින් ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කර ඇති බව මා දරන්නා වූ මතය වේ.

**1.2** මතය සඳහා පදනම
-----------------------

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.3** මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාර්ශවයන්ගේ වගකීම්
--------------------------------------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, සමාගම අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය සමාගම ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩපැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා සමාගමේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

සමාගමේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, සමාගමේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යාම අවශ්‍ය කෙරේ.

**1.4** විගණන විෂය පථය
-------------------

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතික වීම උසස් මට්ටමේ සහතිකවීමක් වන

නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සෑම විටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බව අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් හඳුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නාවූ අවදානම් මඟහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබාගැනීම මාගේ මතයට පදනම් වේ. වරදක් නිසා සිදුවන බලපෑමට වඩා වංචාවක් හේතුවෙන් සිදුකරන ලද ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයක් හඳුනා නොගැනීම මගින් සිදුවන්නාවූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මඟහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මඟහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය සහ යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල හා සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල සාධාරණත්වය ඇගයීම.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් සමාගමේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාළත්වය තීරණය කරන ලදි. ප්‍රමාණවත් අවිනිශ්චිතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම්වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව් කිරීම ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතු වේ. මාගේ නිගමනයන් විගණකගේ වාර්තාවේ දිනය දක්වා ලබා ගන්නා ලද විගණන සාක්ෂි මත පදනම් වේ. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් විය හැකිය.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගයීම.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ සමාගමේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ සමාගමේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, සමාගම ක්‍රියාකර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,

- සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නීතිරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව.

**1.5** බදු රෙගුලාසි වලට අනුකූල නොවීම

| | විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතට අනුව, සමාගම සංස්ථාගත කළ දින සිට සමාගම දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට කිසිදු ආදායම් බදු වාර්තාවක් ඉදිරිපත් කර නොතිබුණි. කෙසේ වෙතත්, 2019 දෙසැම්බර් 31 දක්වා ආදායම් බදු ප්‍රතිපාදන රු.13,029,227 ක් වූ අතර එය මේ දක්වා ගෙවා නොතිබුණි . | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | 2017 අංක 24 දරණ දේශීය ආදායම් පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (ආ) | 2002 අංක 14 දරණ අගය එකතු කළ බදු පනතට අනුව, | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | 2002 අංක 14 දරණ අගය එකතු කළ බදු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (i) | සෑම සේවා සපයන්නෙක්ම සෑම සති දෙකකට වරක් වැට් බදු ගෙවිය යුතුය. කෙසේ වෙතත්, සමාගම දින 55 සිට 149 දක්වා ප්‍රමාදයකින් ගෙවීම් කර තිබුණි. | | |
| (ii) | එක් එක් කාර්තුවෙන් පසු මාසයේ අවසාන දිනයේ හෝ ඊට පෙර එකතු කළ අගය මත බදු වාර්තා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, දින 127 සිට 134 දක්වා ප්‍රමාදයකින් වැට් බදු වාර්තා ඉදිරිපත් කර තිබුණි. | | |
| (ඇ) | 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතට අනුව (නිසි පරිදි සංශෝධනය කරන ලද), | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | 2009 අංක 9 දරණ ජාතිය ගොඩනැගීමේ බදු පනතේ (නිසි පරිදි සංශෝධනය කරන ලද) විධිවිධානවලට අනුකූල විය යුතුය. |
| (i) | එක් එක් කාර්තුවෙන් පසු මාසයේ අවසාන දිනයේ හෝ ඊට පෙර NBT වාර්තා ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, දින 53 සිට 137 දක්වා ප්‍රමාදයකින් NBT වාර්තා ඉදිරිපත් කර තිබුණි. | | |

| | | | |
|---|---|---|---|
| | **(ii)** **NBT** ගෙවිය යුත්තේ ඊළඟ මාසයේ **20** වන දිනට හෝ ඊට පෙරය. කෙසේ වෙතත්, දින **50** ක ප්‍රමාදයකින් **NBT** ගෙවීම් කර තිබුණි. | | |
| (ඇ) | **1982** අංක **43** දරණ මුද්දර ගාස්තු පනතට අනුව (සංශෝධිත පරිදි), | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | **1982** අංක **43** දරණ මුද්දර ගාස්තු පනතේ විධිවිධානවලට අනුකූල විය යුතුය (සංශෝධිත පරිදි). |
| | **(i)** සංයුක්ත කළ මුද්දර ගාස්තු ප්‍රකාශය කාර්තුව අවසන් වීමෙන් පසු ඊළඟ මාසයේ පහළොස්වන දිනට හෝ ඊට පෙර ඉදිරිපත් කළ යුතුය. කෙසේ වෙතත්, සංයුක්ත කළ මුද්දර ගාස්තු ප්‍රකාශය දින **46** සිට **72** දක්වා ප්‍රමාදයකින් සිදු කර තිබුණි. | | |
| | **(ii)** මුද්දර ගාස්තු ගෙවීම ඊළඟ මාසයේ **15** හෝ ඊට පෙර ගෙවීමට සමාගම අපොහොසත් වි තිබුණි. | | |

## 2. මූල්‍ය සමාලෝචනය

### 2.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශනවලට අනුව, **2019** දෙසැම්බර් **31** දිනෙන් අවසන් වර්ෂය සඳහා සමාගමේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.**2,157,474** ක් වූ බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපව පෙර වර්ෂයේ සමාගමේ බදු පෙර ශුද්ධ ලාභය රු.**113,900** ක් විය. ඒ අනුව සමාලෝචිත වර්ෂය සඳහා මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.**2,043,574** ක වැඩිදියුණු වීමක් නිරීක්ෂණය විය. සමාගමට සේවකයින් **76** ක් බඳවා ගැනීම නිසා මිනිස් බල යෙදීම් සේවා ආදායම රු.**1,887,262** කින් ඉහළ යාම මෙම වැඩිදියුණු වීමට ප්‍රධාන හේතු විය.

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| විධිමත් පරිදි අනුමත කරන ලද බඳවා ගැනීමේ පටිපාටියක් (SOR) රහිතව සමාගමේ කාර්ය මණ්ඩල බඳවා ගැනීම් සිදු කර තිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | **2003** ජූනි **02** දිනැති අංක පීඊඩී/**12** දරන රාජ්‍ය ව්‍යාවසාය චක්‍රලේඛයට අනුව, බඳවා ගැනීමේ පටිපාටිය (SOR) පිළියෙළ කර අනුමත කර ගැනීමට කටයුතු කළ යුතුය. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාවසාය චක්‍රලේඛයට අනුව සහ 2007 ඔක්තෝබර් 02 දිනැති අංක පීඊඩී/45 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයට අනුව, මූල්‍ය වසර අවසාන වීමෙන් පසු දින 60 ක් තුළ කාර්යසාධන වාර්තාවේ කෙටුම්පතක් සමඟ අනුමත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපතිවරයාට ඉදිරිපත් කළ යුතු වුවද, සමාගමේ 2019 වර්ෂය සඳහා වන මූල්‍ය ප්‍රකාශන 2020 ජූලි 13 දින විගණකාධිපති වෙත ඉදිරිපත් කර තිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |
| (ආ) | 2016 සිට වාර්ෂික වාර්තා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර සභාගත කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූල විය යුතුය. |

### 4.2 සංයුක්ත සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාවසාය චක්‍රලේඛය ප්‍රකාරව, සමාගම විසින් සංයුක්ත සැලසුමක් පිළියෙළ කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

### 4.3 වාර්ෂික ක්‍රියාකාරී සැලැස්ම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාවසාය චක්‍රලේඛය ප්‍රකාරව, සමාගම විසින් වාර්ෂික ක්‍රියාකාරී සැලසුමක් පිළියෙළ කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | චක්‍රලේඛ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුය. |

**4.4** අභ්‍යන්තර විගණනය

| විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අභ්‍යන්තර විගණන අංශයක් ස්ථාපනය කර නොතිබුණු අතර 2019 වසරේ දි විදුලිබල හා පුනර්ජනනීය බලශක්ති අමාත්‍යාංශය සහ ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශය මගින් කිසිදු විගණනයක් සිදු කර නොතිබුණි. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | නිසි අභ්‍යන්තර පාලනය සඳහා අභ්‍යන්තර විගණනය සිදු කළ යුතුය. |

**4.5** අයවැය පාලනය

| විගණන නිරීක්ෂණ | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2019 වර්ෂය සඳහා අනුමත අයවැය ලේඛනයක් සමාගම සතු නොවීය. එබැවින්, තථ්‍ය කාර්යසාධනය සහ අසාමාන්‍ය විචලනයන් සමාලෝචනය කළ නොහැකි විය. | කළමනාකරණයේ අදහස් දැක්වීම් ලබා දී නොමැත. | 2003 ජූනි 02 දිනැති රාජ්‍ය ව්‍යවසාය චක්‍රලේඛ අංක පීඊඩී/12 ප්‍රකාරව, අයවැය ලේඛනය සකස් කර ඒ සඳහා අනුමතිය ලබා ගත යුතුයි. |